# වරු ගුරු

**අජිත් පැරකුම් ජයසිංහ**

අද ලෝක ගුරු දිනයනේ. මම ගුරු වෘත්තියෙන් සමු අරගෙන අවුරුද්දක් පිරෙනවා.

1993දී ගුරු වෘත්තිය තෝරාගෙන ඈත පදවියට යන්නට තීරණය කරනකොටත් මම පුවත්පත් කලාවේදියකු ලෙස වැඩ කරමිනුයි හිටියේ. එහේ ගිහිනුත් මම පදවියේ ලංකාදීප, යුක්තිය පත්තරවල වාර්තාකරු වෙලා හිටියා. අවුරුදු විසි ගණනකට පස්සෙ ගුරු වෘත්තිය ඇති ය කියලා හිතුණාට පසුව පාරට බැස්සාමත් පනං හතරක් හොයා ගන්න ඒ කුසලතාව ඉවහල් වුණා.

ගුරු වෘත්තියෙන් ඉවත් වුණ එක ගැන මට තවමත් හිතේ කණස්සල්ලක් තියෙනවා. ඒත්, එකම රැකියාව හැමදාම කරන එක ලොකු තේරුමක් ඇති දෙයක් නෙමෙයි. අනෙක්

**<u>බොහෝ දෙනෙක් හිතාගෙන ඉන්නවා ගුරු වෘත්තිය අයිස් ජොබ් එකක් කියලා. එහෙම හිතලා ගුරුවරියන් කසාද බඳින මහත්තුරු විතරක් නෙමෙයි, ගුරු වෘත්තියට එන නෝනලා හා මහත්තුරුත් ඉන්නවා.</u>**

පැත්තෙන්, තමන්ට ඒ රස්සාවෙන් උපරිමය කරන්නට බැරි වෙනකොට ඉවත් වෙන එක හොඳයි. ගුරු වෘත්තිය රැකියාවක් විතරක් නොවෙයි.

බොහෝ දෙනෙක් හිතාගෙන ඉන්නවා ගුරු වෘත්තිය අයිස් ජොබ් එකක් කියලා. එහෙම හිතලා ගුරුවරියන් කසාද බඳින මහත්තුරු විතරක් නෙමෙයි, ගුරු වෘත්තියට එන නෝනලා හා මහත්තුරුත් ඉන්නවා.

"පැය හයයි නේ. සෙනසුරාදා, ඉරිදා නිවාඩු නේ. නිවාඩු කාල තුනකුත් තියෙනවනේ."

වරුවක් වැඩ කරන නිසා අපි ඉස්සර අපේ රස-"සාවට වරු ගුරු කියලා විහිළුවට කිව්වා. ඒ වුණාට, ගුරුවරයා වැඩ කරන කාලය නිසි ලෙස නිර්ණය කිරීම කියන කාරණය යුනෙස්කෝ සංවිධානයේ පවා සාකච්ඡාවට භාජනය වෙලා තිබෙනවා. මම නම් හිතන්නේ ගුරුවරයකු වැඩ කරන කාලය ගණනය කිරීම දුෂ්කරයි.

මුල් පත්වීම අරගෙන පදවියේ පාසලේ ගුරු නිවාසයේ නතර ව සිටි කාලයේ අපි ගුරු වෘත්තියේ ජීවත් වුණා. උදේට පාසලේ උගන්නලා, සවසට ළමයි එක්ක සෙල්ලම් කරලා, රෑට ගමේ මිනිසුනුත් එක්ක කැළෙන් එන කොටි ගැන බය වෙන්න සිදු වුණ යුගයක් ඒක. පාසලේ හිටපු සති අන්තවලත් අපි නාට්‍ය, ක්‍රීඩා ආදිය කළා.

ගුරුවරයා පොත පත කියවන්නට, මාධ්‍ය ඇසුරු කරන්නට ගත කරන කාලයත් ඔහුගේ වෘත්තීය ඵලදායිතාවට සෘජුවම බලපානවා. හැබැයි, දැන් නම් ගුරුවරුන්ගේ පාසල් කාලයෙන් සැලකිය යුතු කාලයක් කඩදාසි පුරවන්නට ගත වෙනවා. හවසට ටියුෂන්

කරන්නට ගත වන කාලය ගුරුවරයාගේ ගුරු පෞරුෂය වර්ධනයට ඉවහල් වෙනවා ය කියා මම නම් හිතන්නේ නැහැ. ඒ වුණත්, ගුරුවරුන්ට ගෙවන සුළු වැටුප අරගෙන පවා, ගරාජ්වල, මඩුවල හවසට පීචං වෙලා වුණත්, කලිසමක්, සාරියක් පිළිවෙලට අඳින්නට පුළුවන් වෙලා තියෙන්නේ ටියුෂන් නිසායි.

මගේ ගුරු ජීවිතේ වැඩි කාලයක් ගෙවුණේ දුෂ්කර පාසල්වලයි. ඒ නිසා සෑහෙන කාලයක් මගට ගෙවී ගියා. ඒ වුණත්, ඒ පාසල්වලදි ලබපු සතුට නගරයේ පාසල්වලදි ලැබුණෙ නැති තරම්. ඒකට හේතුව නගරයේ පාසල්වලට එන විට මිනිස් සම්බන්ධකම් වා-නිජකරණය වී තිබීම වැඩි වීමයි.





පස්සෙ කාලෙක මම නාගරික පාසලක ඉගැන්වීමට අමතරව ක්‍රිකට් ක්‍රීඩාවත් භාර ගත්තා. ඒක කිසිදු විවේකයක් නැති පැය 24 රස්සාවක් වගේ. ඒ වගේ ම, කිසිදු අමතර ගෙවීමකුත් නැති, අතින් කා හරක් බැලීමක්. එහෙම කරලාත්, කිසිම දවසක හොඳක් අහන්නත් නො ලැබුණු යුගයක් ඒක. විශේෂයෙන් ම විවිධ පාසල්වල ආදි ශිෂ්‍ය සංගම්වල කටයුතු නිරීක්ෂණය කරන්නට අවස්ථාවක් ඒ සමග ලැබුණා. ආදි ශිෂ්‍යයන්

අධ්‍යාපන පද්ධතියේ වර්තමානයේ ඔවුන්ට හිමි තත්වයෙන් ඈත් කළ යුතුයි කියන මතයේ මම දැඩිව එල්බ ගත්තේ මේ කාලයේ මගේ අධ්‍යයනවල ප්‍රතිඵලයක් ලෙසයි.

ගුරුවරයෙකු වුණා ම, තමන් උගන්වන විෂයට අමතරව, විවිධ දේ ගැන දැනුම වගේ ම විවිධ

සමාජ අත්දැකීමුත් ඉතා වැදගත් වෙනවා. ඒ නිසා ගුරුවරයා කියවන පොත්පත්, යෙදෙන සමාජ කටයුතු ආදියත් ඔහුගේ වෘත්තීය ජීවිතයේ ම කොටස්.

මෑත කාලීනව ගුරු වෘත්තිය සම්බන්ධයෙන් ඇති වුණ වැදගත් ම සාකච්ඡාවට මුල පිරුණේ සමන්ති මනෝහාරි පැලකැටිය ගුරුවරියට රුපියල් ලක්ෂ දෙකක වන්දියක් ගෙවන්නට කොළඹ මහානාම විද්‍යාලයේ හිටපු විදුහල්පති ප්‍රේමලාල් කුමාරසිරිට හා එම විද්‍යාලයේ ගුරු-වරයකු ලෙස කටයුතු කළ තුසිත තිළිණ මාලේගොඩ නමැත්තාට ශ්‍රේෂ්ඨාධිකරණය නියෝග කළ නඩුවත් එක්කයි.

බ්ලොග්කරණයේ, පුවත්පත්වලට ලිවීමේ යෙදී සිටින ගුරුවරුන් වගේ ම වෙනත් රජයේ සේ-වකයිනුත් මගෙන් විවිධ අවස්ථාවල අසා තිබෙන කාරණයක් වන්නේ ඔවුන්ට එසේ කිරීමට නීතියෙන් ඉඩක් තිබේ ද යන්නයි. එහෙම ඉඩක් තිබෙනවා. එහෙත්, ආයතන සංග්‍රහය විසින් එම ඉඩ සීමා කරලාත් තිබෙනවා.

ඒ අනුව ගුරුවරයකුට මල් වැවීම, මුද්දර එකතු කිරීම, කේක් සෑදීම, සාරි හැට්ට මැසීම වැනි දේ ගැන කතා කරන්නට පූර්ණ නිදහස තිබෙනවා. හැබැයි, අධ්‍යාපනය පිළිබඳ විවෘත අදහස් ප්‍රකාශ කරන්නට හැකියාවක් නැහැ.

අධ්‍යාපන බලධාරීන් සමන්ති මනෝහාරි පැලකැටිය ගුරුවරියගේ වැඩ තහනම් කරන්නේ ආයතන සංග්‍රහයේ xxxi වැනි පරිච්ඡේදයේ 3.2 වගන්තිය භාවිතා කරලා, මාධ්‍යයට ප්‍රසිද්ධියේ අදහස් දැක්වූවා ය කියන චෝදනාව මතයි.

එහෙත් දැන් ශ්‍රේෂ්ඨාධිකරණය මෙම වැඩ තහනම් කිරීම වැරදි බව ප්‍රකාශයට පත් කර තිබෙනවා. SC/FR/76/2012 අංක දරණ මූලික මානව හිමිකම් පෙත්සමේ තීන්දුව ඓතිහාසික එකක් වන්නේ ඒ නිසායි. එම ගුරු-වරියට එරෙහිව ගත් ක්‍රියාමාර්ග හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන වගන්තියේ ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ ලෙස ලැබීමට ඇයට ඇති අයිතිය කඩ වී ඇති බවත්, 14(1) වගන්තිය අනුව ඇයට හිමි භාෂණයේ සහ ප්‍රකාශනයේ අයිතිය ද කඩකොට ඇති බවත් ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කරනවා.

2016 තොරතුරු දැනගැනීමේ පනත සම්මත වුණායින් පස්සේ ආයතන සංග්‍රහයේ මේ ප්‍රතිපාදනය නිර්බල වෙන බව නීතිඥ ජගත් ලියනආරච්චි රාවය පුවත්පතට පවසා තිබෙනවා.

තොරතුරු සම්බන්ධ ආකල්ප, මාධ්‍ය හා සන්නිවේදනය විශාල පරිවර්තනයකට ලක් වෙද්දී රජයේ සේවකයන්ගේ ආයතන සංග්‍රහය එක තැන පල් වෙනවා.

ඒ සම්බන්ධයෙන් නඩුවක් පැටලේවා කියා බලාපොරොත්තුවෙන් තමයි මම පසුගිය කාලේ අධ්‍යාපනය සම්බන්ධයෙනුත් විවෘතව ම බ්ලොග්කරණයේ යෙදුණේ. එහෙම නඩුවක් පැවරුණා නම් අපට මේ ගැන වඩා විවෘත සාකච්ඡාවක් ආරම්භ කරන්න තිබුණා. ඒත්, මම විශ්‍රාම යනකල් ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව ප්‍රසිද්ධියේ මාධ්‍යකරණයේ යෙදීම සම්බන්ධයෙන් මට එරෙහිව කටයුතු කළේ නැහැ.

මේක තවත් උදාහරණයකින් දක්වනවා නම්, ආයතන සංග්‍රහයේ රජයේ සේවකයන් විදේශගත වීම සම්බන්ධ නීති නැව්වලින් පිටරට යන කාලේ හදපු ඒවායි.

තමන්ට ලිංගික අඩන්තේට්ටම් කිරීමට පවා යොමු වූ බලවතුන්ට එරෙහිව නො බියව සටන් කළ සමන්ති මනෝහාරි පැලකැටිය වගේ ගුරු-වරියන් තමයි වර්තමානයට අවශ්‍ය.

